ඇමුණුම - 02


සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
**Department of Samurdhi Development**

කාන්තා, ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය - සමාජ ආරක්ෂණ අංශය
மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் சமூக பாதுகாப்பு அமைச்சு - சமூகபாதுகாப்பு பிரிவு
Ministry of Women, Child Affairs and Social Security - Social Security Division


| මගේ අංකය / எனது இல / My No | ඔබේ අංකය / உமது இல / Your No | දිනය / திகதி / Date |
|---|---|---|
| DSD/HO/04/ER/09/ශිල්පිය සවි. - 2020 | | 2020.01.30 |

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන් වෙත,

**<u>සමෘද්ධි ශිල්පිය සවිබලකරණ වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන - 2020</u>**

ඔබ දිස්ත්‍රික්කයේ ග්‍රාමීය හා නාගරික ප්‍රදේශ වල රැකියා අපේක්ෂාවෙන් පසුවන සහ රැකියා විරහිත තරුණ තරුණියන් ඉලක්ක කර "සමෘද්ධි ශිල්පිය සවිබලකරණය" නම් වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව අපේක්ෂා කර ඇත. මෙය ජාතික වැඩසටහනක් ලෙස ඉදිරියේදී දිවයින පුරා ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන අතර තෝරා ගනු ලබන පුහුණුලාභීන්ට විශේෂ කාල සීමාවක් තුල පුහුණුව ලබාදීමට යෝජිතය.

02. මේ යටතේ පහත සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනිමට දෙපාර්තමේන්තුව බලාපොරොත්තු වනු ඇත.

I. වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන සම්බන්ධයෙන් ප්‍රජාව දැනුම්වත් කිරීම හා ඔවුන් පිළිබඳ දත්ත, තොරතුරු තාක්ෂණ පද්ධති හරහා ලබාගෙන ගබඩා කිරීම.
II. රැකියා විරහිත තරුණ ප්‍රජාව සුදුසු වෘත්තීය ක්ෂේත්‍ර වල රැකියාවන් සඳහා යොමු කිරීම.
III. තරුණ ප්‍රජාවගේ රැකියා යෝග්‍යතාවය සංවර්ධනය හා අවිධිමත් අංශ ප්‍රවර්ධනය තුලින් ව්‍යවසායකයින් ලෙස නගා සිටුවීම.
IV. ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ රැකියා සඳහා යොමු කිරීමට අවශ්‍ය පහසුකම් සලසාදීම.
V. පාසල් අධ්‍යාපනය අවසන් කර ශ්‍රම වෙළඳපොලට එක්වන තරුණ ප්‍රජාවට වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ වැඩසටහන් වලට පිවිසීමට මන්පෙත් විවර කරදීම.
VI. පෞද්ගලික අංශ අපේක්ෂා කරන වෘත්තීය කුසලතාවයන් ප්‍රගුණ කිරීමට අවශ්‍ය පුහුණුව ලබාදී, වෘත්තිකයින් / ව්‍යවසායකයින් බිහිකිරීම.

03. මෙම ජාතික වැඩසටහන සාර්ථක කිරීම සඳහා වෘත්තීය පුහුණු අධිකාරියේ (VTA) හා ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීම් අධිකාරියේ (NAITA) දායකත්වය සැපයීමට 2020.01.29 දින අමාත්‍යාංශ ලේකම්තුමියගේ ප්‍රධානත්වයෙන් පැවති සාකච්ඡාවේදී එම ආයතනයන් එකඟතාවය පළ කරන ලදී. ඒ අනුව ඔබ දිස්ත්‍රික්කයේ මෙම වැඩමුළු සංවිධානය කිරීම ඊළඟ පියවර වන බව කාරුණිකව ඔබ වෙත දැනුම් දෙමි.

D/jeev/Sen/2020 Letter/Sen.


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අධ්‍යක්ෂ (පාලන හා ආයතන) / பணிப்பாளர் ( நிர்வாகம்/தாபனம்) / Director (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873006 | 011-2869742 | 011-2887469 | |

04. එමෙන්ම එක් වැඩමුළුවක් සඳහා අවම වශයෙන් අර්ථලාභීන් 500 දෙනෙකුවත් සහභාගී කරවීම අත්‍යාවශ්‍ය වන අතර ආරම්භයේදී දරිද්‍රතාවේ ඉහළ අගයක් පෙන්නුම් කරන සබරගමුව, උතුර හා වයඹ යන පළාත් වල මෙම වැඩසටහන් පැවැත්වීමට අපේක්ෂිතය. ආරම්භක වැඩමුළු 02 රත්නපුර හා කෑගල්ල යන දිස්ත්‍රික්ක වල පැවැත්වෙන අතර **කෑගල්ල දිස්ත්‍රික් ප්‍රජාව දැනුම්වත් කිරීමේ වැඩමුළුව 2020 පෙබරවාරි මස 10 දින පැවැත්වීමට මේ වන විටත් කටයුතු සූදානම් කර ඇත.**

05. මෙම වැඩසටහන යටතේ පැවැත්වීමට අපේක්ෂා කරන වෘත්තීය පාඨමාලා පිළිබඳ තොරතුරු මේ සමඟ අමුණා ඇති අතර ඒ සඳහා කැමැත්තන් දක්වන ප්‍රජාව දැනුම්වත් කිරීමට හා අදාල දිනයන්හී ඔවුන් කැඳවීමට කටයුතු කරන ලෙස කාරුණිකව දැනුම් දෙමි.

ආර්.පී.බී තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්
කා/පි

පිටපත්:-

1. කාන්තා ළමා කටයුතු සහ සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, සහ සමාජ ආරක්ෂණ ගරු අමාත්‍ය පවිත්‍රා දේවී වන්නිආරච්චි මැතිනිය - කා.දැ.ගැ.පි.
2. සමාජ ආරක්ෂණ රාජ්‍ය අමාත්‍ය ගරු තාරක බාලසූරිය මැතිතුමා - කා.දැ.ගැ.පි.
3. කාන්තා හා ළමා කටයුතු රාජ්‍ය අමාත්‍ය විජිත බේරුගොඩ මැතිතුමා - කා.දැ.ගැ.පි.
4. ලේකම්, කාන්තා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය - කා.දැ.ගැ.පි.
5. ලේකම්, සමාජ ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය- කා.දැ.ගැ.පි.
6. සභාපති, වෘත්තීය පුහුණු අධිකාරිය - කා.දැ.ගැ.පි.
7. සභාපති, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය - කා.දැ.ගැ.පි.
8. ශාන්ති එදිරිසිංහ මිය,' අධ්‍යක්ෂ පුහුණු,වෘත්තීය පුහුණු අධිකාරිය (මේ පිළිබඳව 2020.01.29 දින පැවති අප අමාත්‍යාංශයේදී පැවති සාකච්ඡාව අනුව කෑගල්ල දිස්ත්‍රික් වැඩමුළුව 2020 පෙබරවාරි 10 දින පැවැත්වීමට නියමිත අතර ඒ සඳහා අවශ්‍ය සහාය ලබාගැනීම සඳහා කා.දැ.ගැ.පි.
9. ඩබ්.ඒ.කේ.එස්. කුමාර මහතා, සහකාර අධ්‍යක්ෂ පුහුණු, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය - (මේ පිළිබඳව 2020.01.29 දිනු පැවති අප අමාත්‍යාංශයේදී පැවති සාකච්ඡාව අනුව කෑගල්ල දිස්ත්‍රික් වැඩමුළුව 2020 පෙබරවාරි 10 දින පැවැත්වීමට නියමිත අතර ඒ සඳහා අවශ්‍ය සහාය ලබාගැනීම සඳහා කා.දැ.ගැ.පි.
10. සියළුම අංශ ප්‍රධානීන් , සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි.
11. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, කෑගල්ල - (2020 පෙබරවාරි 10 දින පැවැත්වීමට නියමිත සමෘද්ධි ශිල්පීය සවිබලකරණ වැඩමුළුව පැවැත්වීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීමට කා.දැ.ගැ.පි.

**වෘත්තීය පුහුණු අධිකාරිය හා ජාතික ආධුනිකත්ව කාර්මික පුහුණු අධිකාරිය මඟින් පවත්වනු ලබන පාඨමාලා**

1. වැඩිහිටියන් රැකබලා ගැනීමේ පාඨමාලාව (Elder Care Programme)
2. දිවා සුරැකුම් පුහුණු පාඨමාලාව (Child Care Programme)
3. පරිගණක දෘඩාංග ක්‍රියාකරු
4. සම් භාණ්ඩ හා පාවහන් තැනුම් ශිල්පී
5. ශීතකරණ හා වායු සමීකරණ කාර්මික ශිල්පී
6. කාර්ය අධ්‍යයන නිලධාරී
7. රූපලාවණ්‍ය ශිල්පී
8. ගොඩනැගිලි පින්තාරු ශිල්පී
9. ගෘහස්ථ විදුලි උපකරණ පිළිසකර ශිල්පී
10. ත්‍රිරෝද රථ කාර්මික ශිල්පී
11. විදුලි මෝටර් එතුම් ශිල්පී
12. දැව කාර්මික (ගෘහ භාණ්ඩ)
13. දැව කාර්මික (ගොඩනැගිලි)
14. ස්වර්ණාභරණ ගල් බැදුම් ශිල්පී
15. කර්මාන්ත ක්ෂේත්‍රයේ ජලනල කාර්මික ශිල්පී
16. මෝටර් රථ වෑද්දුම් ශිල්පී
17. ජෛව වෛද්‍ය තාක්ෂණ ශිල්පී.
18. පළතුරු සහ එළවළු සැකසුම් ශිල්පී
19. බොයිලේරු ක්‍රියාකරු
20. හෙදි සහායක
21. පරිගණක ආශ්‍රිත වර්ණ ගැලපුම්කරු (ඇඟලුම්)
22. තොරතුරු හා සංනිවේදන තාක්ෂණ ශිල්පී
23. ගොඩනැගිලි උපකරණ අලුත්වැඩියා කාර්මික
24. ගොඩනැගිලි ඉදිකිරීම් උපකරණ ක්‍රියාකරු
25. මෝටර් බෝට්ටු කාර්මික (පිටත සවිකරන ලද)
26. රෙදි කපන්නා
27. ජල නළ කාර්මික ශිල්පී
28. රබර් සැකසුම් යන්ත්‍ර ක්‍රියාකරු
29. පරිගණක ප්‍රකාශන ශිල්පී
30. ලෝහ පිරිසැකසුම්කරු

31. ඇලුමිනියම් පිරිසැකසුම්කරු
32. ස්වර්ණාභාරණ සාදන්නා
33. පරිගණක ජාල කාර්මික ශිල්පී
34. පරිගණක චිත්‍ර නිර්මාණකරු
35. යන්ත්‍ර ශිල්පී
36. විදුලි කාර්මික ශිල්පී
37. අරක්කැමි
38. විකුණුම්කරු (සුපිරි වෙළඳසැල් / සාමාන්‍ය)
39. කාමර සේවක
40. ඇඳුම් මසන්නා
41. මෝටර් රථ පින්තාරු ශිල්පී
42. පරිගණක යෙදවුම් ශිල්පී
43. කම්බි නැවුම් ශිල්පී
44. ආවුද හා අච්චු තැනුම් ශිල්පී
45. මෝටර් රථ විදුලි කාර්මික ශිල්පී
46. මෝටර් සයිකල් කාර්මික ශිල්පී
47. අධිවේගී මහන මැෂින් ක්‍රියාකරු
48. කොන්ඩා මෝස්තර ශිල්පී
49. ඉදිකිරීම් කාර්මික (පෙදරේරු)
50. බේකරි ශිල්පී
51. මෝටර් රථ විදුලි කාර්මික ශිල්පී
52. ලිතෝ යන්ත්‍ර මෙහෙයුම් ශිල්පී
53. පෑස්සුම් ශිල්පී
54. සම්පීඩිත වායු කාර්මික ශිල්පී
55. ගබඩා භාරකරු
56. තේ කර්මාන්ත ශාලා යාන්ත්‍රික ශිල්පි
57. තැබෑරුම් පාලක
58. ගුවන් විදුලි රූපවාහිනී ආශ්‍රිත උපකරණ අලුත් වැඩියා කරන්නා
59. වෑද්දුම්කරු
60. පොත් බඳින්නා
61. තත්ත්ව පාලක (ඇඟළුම්)
62. කර්මාන්ත ඉලෙක්ට්‍රොනික් යන්ත්‍ර ශිල්පී
63. පැළැටි තවාන් සංවර්ධන සහායක
64. ලේකම් (පරිචය)

65. මුදල් අයකැමි
66. බර වාහන ක්‍රියාකරු
67. හෙද සහායක
68. ගොඩනැගිලි ඉදිකිරීම් වැඩබිම අධීක්ෂක
69. ප්‍රමාණ සමීක්ෂක
70. නිෂ්පාදන සුපරීක්ෂක (ඇඟළුම්)
71. පතරොම් සකස් කරගන්නා (ඇගළුම්)
72. අවන්හල් සේවක
73. මහන මැෂින් කාර්මික ශිල්පී
74. රෙදි පරීක්ෂක (ඇඟළුම්)
75. මුද්‍රණ යන්ත්‍ර ශිල්පී
76. ආලෝකකරණ ශිල්පී ඡායාරූපකරණය)
77. මැණික් කපන්නා සහ ඔප දමන්නා
78. පෙර පාසල් ගුරු වෘත්තීය
79. ඡායාරූප ශිල්පී
80. අලෙවි නියෝජිත සහකරු
81. කෘෂිකර්ම ක්ෂේත්‍ර සහකරු
82. පිළිගැනීමේ නිළධාරී
83. නිෂ්පාදන තාක්ෂණය
84. පැස්සුම් තාක්ෂණය
85. ආහාර නිෂ්පාදන තාක්ෂණය
86. ඉදිකිරීම් තාක්ෂණය
87. ශීතකරණ හා වායු සමීකරණ තාක්ෂණය
88. මෝටර් රථ තාක්ෂණය
89. ගොවිපළ ආශ්‍රිත උපකරණ තාක්ෂණය
90. ස්වර්ණාභරණ නිමැවුම් හා නිෂ්පාදන තාක්ෂණය
91. සැකසුම් ශිල්පීය තාක්ෂණය
92. විදුලි සංනිවේදන තාක්ෂණය